# ජෛව විවිධත්වය සුරැකීම සඳහා, වන වැදී ඇති බළලුන්, මිලියන දෙකක් ඝාතනය කිරීම



දයාරත්න වීරසේකර

- සුරතල් සතුන් වුවද පාලනයෙන් ගිලිහී ගියහොත් විනාශකාරී විය හැකිය.
- දඩාවතේ යන බළලුන් මහා විපතකි.
- බළලුන් සඳහා 'ඇඳිරි නීතියක්'

බොහෝ අය සුරතල් සතුන් ඇති කිරීමට මහත් කැමැත්තක් දක්වති. සමහර සුරතල් සතුන් ගෙදර සාමාජිකයින්ම ලෙස සැලකීමක් දක්වන අයද සිටිති. බල්ලන් සහ බළලුන් සුරතල් සතුන් ලෙස ඇති කිරීම, මිනිස් ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම පැවති බව පෙනේ. වසර හාරදහසකට පමණ පෙර සිටි ඊජිප්තු වාසීන්ද බළලුන් හීලෑ කර සුරතල් සතුන් ලෙස ඇතිකර තිබෙන බව කියැවේ.

D'L' Brown විසින් රචිත *The Adventures of An Awful House Cat* යන ළමා පොත කියවා ඇති අය, ගෙදර ඇතිකරනු ලබන බළලෙකුගේ, අපූර්ව රාත්‍රී චාරිකා පිළිබඳ හොඳ අවබෝධයක් ලබන්නට ඇති බව නිසැකය. මෙම පොතෙහි සඳහන් 'නොරිසී නමැති සුරතල් බළලාගේ හාස්‍ය ජනක ගමන් බිමන් සහ මිතුරු මිතුරියන් ඇසුරු කිරීම ළමා සිත් ඇද ගන්නාසුළු විය. සුරතල් සතුන් අතරින් බල්ලා තම ස්වාමියාට සහ ගෙදර අන් අය සමග ඉතා ලෙන්ගතුව සිටී. එසේ වුවත් බළලුන් හිතවත් කම පෙන්වුවද, බොහෝ විට ආත්මාර්ථකාමී සුරතල් සතුන් බව ප්‍රකටය.

විද්‍යාත්මකව බළලුන් හඳුන්වනුයේ *Felis catus* වශයෙනි. ගෙවල ඇතිකරනු ලබන බළලුන් *Felis catus domesticus* ලෙසද හැඳින්වේ. බළලා 'pussy' යන ඉංග්‍රීසි වචනයෙන් බිඳී ආ 'පූසා' යන සුරතල් නමින් හැඳින්වීම කාගේත් කටට හුරු වදනකි. බළලුන් ඇතිකිරීම පහසුය. ඔවුන්, තමන්ට අවශ්‍ය ව්‍යායාම් තනිවම කර ගන්නා අතර, තනිවම ඇඟපත පිරිසිදු කරගැනීමද ඔවුනට කළ හැකිය. ගෙදරට මීයන් වැනි අහිතකර සතුන් පැමිණීම පාලනය කිරීමටද බළලා සමතෙකි. පොදුවේ *Cats* යන නමින් හඳුන්වනු ලබන *Felidae* හෙවත් බිළාල ගෝත්‍රයට අයත් කොටි, සිංහයින්, ව්‍යාඝ්‍රයින් වැනි මාංශ භක්ෂක විශාල ශරීර සහිත බිළාලයින් බළලුන්ගේ පරිණාමික ඥාතීහු වෙති.



මුල් අවදියේදී යුරෝපීය සංක්‍රමණිකයින් විසින් ඕස්ට්‍රේලියාවට ගෙනෙන ලද බළලුන්, දඩාවතේ ගොස් වල් වැදී වෙනත් සතුන්ට මහත් තර්ජනයක් වී තිබේ. එම තර්ජනයේ ස්වභාවය සහ එම තත්ත්වය මර්දනය කිරීම සම්බන්ධයෙන්, '*Live Science Essentials*' හි ජ්‍යෙෂ්ඨ ලේඛිකාවක් වන *Mindy Weisberger* විසින් 2019 අප්‍රියෙල් 29 වන දින එම ප්‍රකාශණයට ලියන ලද ලිපියක, මහා බළල් සංහාරයක් පිළිබඳ තොරතුරු දක්වා තිබේ.

1700 ගණන් වලදී ඕස්ට්‍රේලියාවේ පදිංචිය සඳහා පැමිණි යුරෝපීය සංක්‍රමණිකයින් විසින් ඔවුන් සමග බළලුන්ද ගෙනැවිත් තිබේ. එකළ, මෙම බළලුන්ගේ හැසිරීම් රටා පිළිබඳ පාලනයක් නොතිබුණු නිසා, සමහර බළල්ලු දඩාවතේ යන්නට පටන් ගත්හ. එසේ දශක කිහිපයක් ගත වන විට, වල් වැදුනු බළල්ලු බහුලව බෝවීම නිසා ඉතා විශාල ගහණයක් ලෙස ව්‍යාප්ත වී තිබේ. දැනට මෙය ඕස්ට්‍රේලියාවේ සිටින විශාලතම බළල් ගහණයයි.

මේ ආකාරයටම අයිතිකරුවන් නොමැති, දඩාවතේ යමින් ගෘහාශ්‍රිතව පමණක් හැසිරෙන දෙවන බළල් ගහණයක්ද බිහිවී තිබේ. දඩාවතේ යාම සීමාවී සිටින ගෙවල ඇතිකරන බළල්ලු තුන්වන කණ්ඩායමයි.

වික්ටෝරියා ප්‍රාන්තයේ මොනෑෂ් කවුන්සිලයට අයිති ප්‍රදේශයේ පමණක්, ලියාපදිංචි කරන ලද ගෙවල ඇති කරන බළලුන් 4,664 ක් සිටින බව වාර්තාවේ.



වල් වැදුනු බළලා

ලෝකයේ කුඩාම මහාද්වීපය වන ඕස්ට්‍රේලියාවේ වල් වැදුනු බළලුන් මිලියන පහකට වැඩි සංඛ්‍යාවක් සිටින බව ඔබ විශ්වාස කරන්නෙහි ද? 2017 වර්ෂයේදී '*The Sydney Morning Herald*' පත්‍රයට ප්‍රකාශයක් කළ ඕස්ට්‍රේලියාවේ, 'වඳවී යාමට ආසන්න සතුන් පිළිබඳ කොමසාරිස් ග්‍රෙගරි ඇන්ඩෲස් විසින් මේ බව පවසා තිබේ.

ඔහුගේ ඇස්තමේන්තුව අනුව, මහාද්වීපය පුරාම සහ අවට දූපත් වලද, වල් වැදී ඇති බළලුන් සිටිති. මෑතදී ලබා ඇති දත්ත අනුව මෙම වල් බළලුන් විසින් ඕස්ට්‍රේලියාවේ වනාන්තර සහ මිනිස් වාසස්ථාන ආශ්‍රිතව ජීවත්වන මිලියනයක් පමණ උරගයින්, එක දිනකදී විනාශ කර දමති.එසේම ඕස්ට්‍රේලියානු වනජීවී සංරක්ෂණ ආයතනයෙන් ලැබී ඇති තවත් තොරතුරකට අනුව, වල් වැදුණු බළලුන් විසින් වාර්ෂිකව, කුරුල්ලන් මිලියන 316 සහ උරගයින් මිලියන 596 පමණ මරා, කා දමන බව සොයාගෙන තිබේ. මේ නිසා ඕස්ට්‍රේලියාවේ දේශීය වනජීවීන් හට වල්වැදුනු බළලුන්ගෙන් වන විපත ඉතාමත් භයානකය.

ඕස්ට්‍රේලියාවේ, තිරසාර බව, පරිසර, ජලය, ජනගහනය සහ ප්‍රජා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ (*Department of Sustainability, Environment, Water, Population and Communities SEWPAC*). වාර්තාවට අනුව මෙම වල් වැදුණු බළලුන්ගේ ග්‍රහණයට අසුවන කුරුළු විශේෂ 35 ක්, ක්ෂීරපායී විශේෂ 36 ක්, උරග විශේෂ 7 ක් සහ උභයජීවී විශේෂ 3ක් සිටිති. ස්වාභාවික පාලනයකින් තොර මෙම වල් වැදුනු බළලුන්ගේ ශීඝ්‍ර බෝවීම නිසා පසුගිය දශක කිහිපය තිස්සේ වනජීවී විශේෂ රාශියක ගහණය තුනී වී ගොස් තිබේ.

සුවිශේෂී ජෛව විවිධත්වයකින් යුක්ත ඕස්ට්‍රේලියාවේ, වනාන්තර ආශ්‍රිතව විලෝපියයෙකු (*predator*) වී ඇති, වනවැදුනු බළලුන්ගේ, ගොදුරු බවට පත්වන අහිංසක සතුන්, වඳවී යාමෙන් බේරා ගැනීම සඳහා වනජීවී බලධාරීන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවී තිබේ. මොවුන් ආක්‍රමණශීලී සත්ත්ව ප්‍රභේදයක ස්වරූපය ගෙන ඇති නිසා ජෛව විවිධත්වය රැකගැනීම පිණිස ආක්‍රමණිකයන් ඉවත් කිරීම විනා, වෙනත් විකල්පයක් නොමැත.

මේ නිසා වටිනා ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා වනවැදුනු බළල් ගහණය සමග මහත් සටනක් කිරීමට සිදුවී තිබේ. පසුගිය දශක කිහිපය තිස්සේ විවිධ ගහණ පාලන



Cats are great companions to many residents in Monash. However they are also natural predators and if they are left to roam at night they can do enormous damage to native wildlife and be a nuisance to residents and that's of concern to Council.

The cat curfew is one of a number of measures in Council's Domestic Animal Management (DAM) Plan, which was adopted at the 31 October 2017 Council meeting.

There are 4,664 registered cats in Monash.

For more info: the Animal

බළල් ඇඳිරි නීතිය පිළිබඳ මොනෑෂ් දැන්වීම

ක්‍රමවේදයන් භාවිත කරනු ලැබුවත්, දිනෙන් දිනම බළල් ගහණය වැඩිවීම මහත් ගැටලුවකි. අවසානයේදී, මෙවැනි උපද්‍රවයකදී ගනු ලබන කෲරතම ක්‍රමය ක්‍රියාත්මක කරන්නට සිදුවී තිබේ. එය නම් අධිකතර ගහණය තිරසාර වන පරිදි, සෙස්සන් විනාශ කිරීමයි. මෙම තීරණය ගත් පසු, 2016 වසරේදී පමණක් වන බළලුන් 211,000 ක් ජීවිතක්ෂයට පත්කළ බවට SEWPAC වාර්තාවක දක්වා තිබේ. 2020 දක්වා කරගෙන යනු ලබන මෙම සංහාරය මගින්, වන බළලුන් මිලියන දෙකක් පමණ විනාශ

20 වන පිටට